**පන්නල ප්‍රාදේශීය සභාව**
**කුරුණෑගල දිස්ත්‍රික්කය**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 30 දින සභාපතිවරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පන්නල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජ'නල් සටහනකින් රු.13,484,855 ක් සමුච්චිත අරමුදලට හර හා වෙනත් ණයගැති ගිණුමට බැර ලෙස සඳහන්ව තිබුණද, අදාළ ලෙජර් ගිණුම්වලට රු.534,372 ක් අඩුවෙන් හර හා බැර කර තිබුණි.

(ආ) සේවක ඇප ආයෝජන රු.40,286 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

### 1.3.2 නොසැසඳුණු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ගිණුම් විෂයයන් 07 ක හිඟ ආදායම් හා ලේඛන අනුව එම ශේෂ අතර රු.2,506,751 ක නොසැසඳීම් පැවතුණි.

(ආ) ස්ථාවර වත්කම්වල ගිණුම්ගත කර තිබුණු වාහන 05 ක පිරිවැය වටිනාකම හා එම වාහනවල ලොග් සටහන් පොත්වල සටහන් කර තිබුණු වටිනාකම අතර රු.2,486,500 ක වෙනසක් පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු ලේඛනය අනුව රු.55,684,198 ක් වූ හිඟ මුද්දර ගාස්තු මූල්‍ය ප්‍රකාශනවල රු.17,197,897 ක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-----------------------------------

(අ) ලැබියයුතු ගිණුම්

--------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.108,659,356 ක් වූ ලැබියයුතු ගිණුම්වලින් වර්ෂ 01 ත් වර්ෂ 03 ත් අතර වූ රු. 4,301,361 ක් සහ වර්ෂ 03 ට වැඩි රු.2,056,152 ක් වූ හිඟ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර, එකතුව රු.61,564,923 ක් වූ ශේෂයන්ට අදාලව කාල විශ්ලේෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ගෙවියයුතු ගිණුම්

---------------------

සමාලෝචිත වර්ෂය අවසානයට රු.123,706,711 ක් වූ ගෙවියයුතු ගිණුම්වලින් රු.33,113,516 ක ශේෂයන්ට අදාලව කාල විශ්ලේෂණ ඉදිරිපත් නොකළ අතර, රු.14,033,139 ක ශේෂයක් වර්ෂ 03 කට වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

### 1.3.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

----------------------------------------------------------------------------

2016 දෙසැම්බර් 29 දිනැති අංක 29/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සභාවේ වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.32,142,497 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.106,766,382 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) වරිපනම් හා බදු | 9,421 | 11,220 | 12,182 | 2,587 | 8,466 | 10,035 | 10,261 | 2,934 |
| (ii) බදු කුලී | 22,310 | 21,464 | 22,238 | 4,128 | 21,419 | 19,848 | 19,447 | 1,703 |
| (iii) බලපත්‍ර ගාස්තු | 1,385 | 1,384 | 1,384 | - | 1,385 | 1,284 | 1,284 | - |
| (iv) වෙනත් ආදායම් | 129,320 | 116,031 | 113,915 | 56,608 | 122,912 | 189,081 | 187,689 | 89,157 |
| එකතුව | 162,436 | 150,099 | 149,719 | 63,323 | 154,182 | 220,248 | 218,681 | 93,794 |

සටහන

සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට පැවති රුපියල් මිලියන 93 ක හිඟ ආදායමින් රුපියල් මිලියන 2.9 ක් සමාලෝචිත වර්ෂයේ රැස්කළ ආදායම තුළ ඇතුළත්ව තිබුණි.

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------------

සමාලෝචිත වර්ෂයට බිල් කිරීම් රුපියල් මිලියන 150 ක් වූ අතර, ඉකුත් වර්ෂවල හිඟ ආදායම් රුපියල් මිලියන 93.7 ක් සමග වූ රුපියල් මිලියන 243.7 කින් රුපියල් මිලියන 149 ක් සමාලෝචිත වර්ෂයේදී අයකර ගෙන තිබුණි. ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 93 ක් වූ හිඟය සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රුපියල් මිලියන 63 ක් වී තිබුණි. සභාව විසින් ආදායම් පාලනයට අදාළව ඉදිරිපත් කර තිබුණු වට්නාකම් ගිණුම් සමග නොසැසඳෙන බව නිරීක්ෂණය විය.

### 2.2.3 වරිපනම් හා බදු

-----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවියයුතු රු.2,587,054 ක් වූ වරිපනම් හා අක්කර බදු හිඟයෙන් වැඩි ප්‍රමාණයක් ඉකුත් වර්ෂවලට අදාළ හිඟ ශේෂ විය.

### 2.2.4 බදු කුලී

----------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයවියයුතු බදු කුලී හිඟය රු.4,128,238 ක් වූ අතර, එය ඉකුත් වර්ෂයේ හිඟයට සාපේක්ෂව සියයට 142 කින් වැඩි වී තිබුණි.

### 2.2.5 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-------------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබියයුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු.19,001,680 ක් සහ රු.17,197,897 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 3.1 කාර්යසාධනය

--------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

------------------

ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 30 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් 2017 දෙසැම්බර් 31 දින වන විට කාරණා 10 ක් සඳහා පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි.

(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

-------------------------------------

දෛනිකව එකතු කරනු ලබන කසළ ටොන් 05 ක පමණ ප්‍රමාණයෙන් දිරන කසළ වෙන්කර පොහොර නිෂ්පාදනය කර තිබුණි. පොහොර නිෂ්පාදනයට සභාව සතුව බේල් මැෂින් නොමැති වීම හේතුවෙන් ලී පෙට්ටියක් යොදාගෙන තිබුණි.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් 2030 න්‍යාය පත්‍රය අනුව 2017 වාර්ෂික අයවැය සකස් කිරීමේදී පරිසර කටයුතු සඳහා හා ළමා හා මාතෘ සෞඛ්‍ය ඉහළ නැංවීමට හා කාන්තා වැඩසටහන් සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබුණි.

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-------------------------------**

ලදුපත් පොත් නිකුත් කිරීම සහ උප පත්‍රිකා ආපසු භාර ගැනීම විධිමත් පරිදි සිදුකර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ද්විතියික, තෘතීයික සහ ප්‍රාථමික තනතුරුවල පිළිවෙලින් 01 ක් 16 ක් සහ 16 ක් වූ පුරප්පාඩුද, ජ්‍යෙෂ්ඨ, ද්විතීයික හා ප්‍රාථමික තනතුරුවල අතිරික්තතා 01 ක්, 20 ක් හා 01 ක්ද පැවතුණි. ප්‍රාථමික තනතුරුවලට අනියම් පදනමින් 08 දෙනෙකු සේවයේ යොදවා තිබුණි.

(ආ) ස්ථාන මාරු වී ගිය, වැඩ තහනම් කරන ලද, සේවය අතහැර ගිය හා කිසිදු සඳහනක් නොමැති වශයෙන් සේවකයින් 16 දෙනෙකුගෙන් රු.56,510 ක ශේෂයක් අයවිය යුතුව තිබුණි.

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2009 වර්ෂයෙන් පසුව ඉදිකර තිබූ දුරකථන කුළුණු 06 කින් පෙරසැරි ගාස්තු අයකරගෙන නොතිබුණි.

(ආ) සභා බල ප්‍රදේශයේ තිබෙන මූල්‍ය ආයතනවලින් ව්‍යාපාර බදු අයකරගෙන නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**----------------------------**

**3.5.1 වත්කම් ලේඛනගත නොකිරීම**

**----------------------------------**

සමාලෝචිත වර්ෂයේදී මිලදීගෙන තිබුණු විදුලි පංකා 02 ක් සහ වතුර මෝටරයක් ලේඛනවලට ඇතුළත් කර නොතිබුණි.

### 3.5.2 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

සභාවට අයත් වත්කම් විෂයයන් 07 ක් අළුත්වැඩියා කර භාවිතයට ගැනීම හෝ අපහරණය කිරීම සිදුකර නොතිබුණි.

### 3.5.3 හඳුනාගත් පාඩු

වටිනාකම රු.187,288 ක් වූ පුස්තකාල පොත් ඌණතාවය වගකිවයුතු පාර්ෂවයන්ගෙන් අයකරගෙන නොතිබුණි.

### 3.5.4 වාහන උපයෝජනය

(i) 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව වාහන 06ක ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 29/30 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව වාහන කොටස්වලට ගලවා පරීක්ෂා කිරීමකින් තොරව වාහන 02 ක් අළුත්වැඩියා කිරීමේදී ගිවිසුම්ගත වටිනාකම ඉක්මවා රු.280,850 ක් අමතර වැඩ විෂයයන්ට ගෙවා තිබුණි.

## 3.7 ප්‍රසම්පාදනය

### 3.7.1 සැපයුම් හා සේවා

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 (ඊ) විධිවිධානවලට පටහැනිව රු.496,235 ක් වූ මිලදී ගැනීම් සිදුකර තිබුණි.

### 3.7.2 කොන්ත්‍රාත් පරිපාලනය

ගිවිසුම්ගත වටිනාකම රු.1,953,115 ක් හා රු.2,154,408 ක් වූ පිළිවෙලින් කුඩහැර වෙල්පල්ල සහ එළිවිල නෙළුම් පොකුණ මාර්ග ගල් අතුරා තාර දැමීම ගිවිසුම් ප්‍රකාරව 2017 ඔක්තෝබර් 19 දින වන විට නිමකළ යුතු වුවද,2018 මාර්තු වන විටද නිමකර නොතිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

-----------------------------------------

### 4.1 අයවැය පාලනය

-------------------

සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 ක ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා රු.3,616,254 ක් වැයකර තිබුණු අතර, ප්‍රාග්ධන වැය විෂයයන්වල එකතුව රු. 125,368,594 ක් උපයෝජනය කර නොතිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයට අනුයුක්ත කාර්ය මණ්ඩලයේ 04 දෙනාට වෙනත් රාජකාරි ද පවරා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී නිකුත් කර තිබුණු අභ්‍යන්තර විගණන විමසුම් 04 ක පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| පද්ධතිය | අඩුපාඩුව |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) නිවැරදි වටිනාකම් හඳුනාගෙන ස්ථාවර වත්කම් ගිණුම්ගත නොකිරීම. |
| | (ii) ගිණුම්වල සටහන් කිරීමේ දෝෂ පැවතීම. |
| (ආ) වත්කම්/දේපල පාලනය | (i) ලේඛනගත නොකිරීම. |
| | (ii) නිශ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම් පැවතීම. |
| (ඇ) ආදායම් පාලනය | හිඟ ආදායම් අයකර නොගැනීම. |
| (ඈ)ව්‍යාපෘති/කොන්ත්‍රාත් අධීක්ෂණය | ප්‍රමාණවත් අධීක්ෂණයක් නොමැති වීම. |